# කෘෂි තාක්ෂණ තොරතුරු

කෘෂි තාක්ෂණ තොරතුරු කඩිනමින් ගොවි ජනතාව අතරට ලබාදීමේ අත්වැලකි

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානයේ ප්‍රකාශනයකි

තාක්ෂණික පත්‍රිකා අංක 50 - 2021 ජූලි


## යාවත්කාල කාලගුණ නිවේදනය
## 2021 යල කන්නයේ ඉතිරි කාලය සඳහා

ජූලි මාසයේ පසුභාගයේ සිට අගෝස්තු මැද දක්වා ගතවෙන කාලය, වියළි හා අතරමැදි කලාපයන්හි යල කන්නය තුළදී වගාකළ වී සහ වර්ෂාපෝෂිත උස්බිම් බෝගයන්හි අස්වනු නෙලන කාලයයි. දැනට පවත්නා වායුගෝලීය හා සාමාන්‍ය දේශගුණික තත්වයන් අනුව මෙම කලාපයන්හි පැවතිය හැක්කේ වියළි කාලගුණික තත්වයකි.

කෙසේවෙතත් දේශගුණයේ සිදුවන විචල්‍යතාවය අනුව වැසි සහිත දින කීපයක් තෙත් කලාපය තුළ බලාපොරොත්තු විය හැකි අතර, පැසිපික් සාගරයේ කුණාටු තත්වයක් වර්ධනය වුවහොත්, ව්‍යාජ නිරිතදිග මෝසම් ආකාරයේ සුළං තත්වයක් නිර්මාණය වීමේ හැකියාවක් ද තිබේ. එවැන්නක් සිදුවන්නේ නම් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මගින් දින 2-3 කට කලින් නිවේදනය කරනු ඇත. මේ නිසා ආරක්ෂක පිළිවෙතක් වශයෙන් එවන් කෙටි හෝ මධ්‍යම පරාසයේ නිවේදයන් කෙරෙහි අවධානයෙන් සිටින ලෙස විශේෂයෙන් තෙත් කලාපීය වගාකරුවන් වෙත නිර්දේශ කර සිටිමු.

මේ අතර, හැකි ඉක්මණින් තම ගොයමේ අස්වැන්න නෙලාගැනීමට කටයුතු කිරීම ද වැදගත්ය. අගෝස්තු මාසයේ මුල් හා මැදි කාල සීමාවේදී අතරමැදි හා වියළි කලාපයන්හි අස්වැන්න නෙලීමේ කටයුතු උපරිමයට සිදුකෙරෙන බැවින් අස්වැන්න නෙලීමේ යන්ත්‍රෝපකරණ සොයාගැනීමේ අපහසුවට මෙම ඉක්මන්වීම යම් සහනයක් සලසනවා ඇත.

**තුන්වෙනි කන්නයේ වගාව**

යල කන්නයේ වී අස්වැන්න නෙලා ගත්තායින් පසු, දැනට කුඹුරේ ඉතිරිව තිබෙන තෙතමනය උපයෝගී කරගනිමින් මුං ඇට වැනි කෙටිකාලීන රනිල බෝගයක් කුඹුරේ වගා කිරීමට ගොවීන් පියවර ගන්නේනම් මැනවි. MI 6 හෝ 7 ප්‍රභේද මේ සඳහා යෝග්‍යවනු ඇත. මෙහි බීජ කුඹුරේ වැපිරීම අගෝස්තු මස මැද භාගයට පෙර සිදුකළ යුතු අතර දින 55 - 65 අතර කාලයකදී අස්වැන්න නෙලාගත හැකිවේ. අඩුම තරමින් අස්වනු වාර දෙකක් ලබාගැනීමෙන් පසු ශාක

අවශේෂයන් තැටි නගුලෙන් කරන ගැඹුරට සීසෑමෙන් කුඹුරු පසටම එකතුකළ යුතුය. තුන්වෙනි වගාව ඇරඹුණු පසු වියළි කාලගුණයක් දිගටම පවතින්නේනම්, වාරි නිලධාරීන් හා සාකච්ඡාකර ප්‍රමාණවත් ජල සංචිත අදාළ වැව් තුළ පවතින්නේනම් බෝගය වෙනුවෙන් වූ අවම ආරක්ෂක දියවරයක් නිකුත් කරගැනීමට කටයුතු කළ හැකිවේ.


**පිටපත : ආචාර්ය බී.වී.ආර් පුන්‍යවර්ධන - ප්‍රධාන කෘෂි කාළගුණ විද්‍යාඥ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**

**සිංහල පරිවර්තනය : සනත් එම්. බණ්ඩාර - සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ, ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය, ගන්නොරුව**



පරිගණක නිර්මාණය : කේ.එම්.ජේ.එම් ඒකනායක

අධීක්ෂණය හා උපදෙස් : ඩබ්.එල් හිරාන් පීරිස් (අධ්‍යක්ෂ - තොරතුරු හා සන්නිවේදන), අයි.එස්.එම් හලීම්දීන් (සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ)